පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1698/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 11/11/2024
පැය 1020

## මාධ්‍ය නිවේදනය

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,
අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,
සියළුම මාධ්‍ය ආයතන.

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරීම.**

01. 2024.11.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 03 | 39 | 595 | තඹ දඟර 01<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලිණ්ඩර් 01<br>යකඩ බැරල් 04 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

02. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුර.**

2024.11.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හම්බන්තොට පොලිස් වසමේදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බන්තොට පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. හම්බන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

03. **ගංජා හේන් දෙකක් වටලා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.11.10 වන දින උදෑසන කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හම්බෙගමුව පොලිස් වසමේ ගල්කඩආර ප්‍රදේශයේදී ගංජා හේන් දෙකක් වටලා ගංජා පැළ **6179 ක්** සමඟ සැකකරුවෙකු සහ ගංජා පැළ **8159 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බෙගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු **41** හා **46** වයස්වල පසුවන තණමල්විල හා කටුවන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ. හම්බෙගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.